[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මත්துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 6 ශ්‍රේණිය | විෂයය - නර්තනය | පත්‍රය I/II | පැය - 2 යි. |
|---|---|---|---|

නම ..........................................................................................................................

**සැලකිය යුතුයි.**

- **පළමු කොටස සඳහා පිළිතුරු ප්‍රශ්ණ පත්‍රයේම සපයන්න.**
- **දෙවන කොටස පිළිතුරු වෙනම කොලයක ලියා හොඳින් අමුණන්න.**

## I කොටස

- **ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **1-5 දක්වා ප්‍රශ්ණවලට වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. පා සරඹ / දණ්ඩියමේ සරඹ නැටීමෙන් පසු නටනුයේ,
   1) හමාර පදය  2) ඉරට්ටිය  3) කලාසම  4) අඩව්ව

2. නර්තනයට ගැලපෙන හස්ත හා පාද චලන සකසා ගැනීමට සිදු කරනු ලබන අභ්‍යාසයක් නොවනුයේ,
   1) නම්‍යතා අභ්‍යාස  2) ගොඩ සරඹ  4) ඉලංගම් සරඹ  4) දොඹින පද

3. හිරු දෙවියන් පිදීම සඳහා හින්දු භක්තිකයින් විසින් පවත්වනු ලබන උත්සවයකි.
   1) රාමසාන්  2) තෛපොංගල්  3) නත්තල  4) වෙසක්

4. නර්තනයක් ආරම්භයට පෙර සම්ප්‍රදායන් තුනෙහිම සිදු කරනුයේ,
   1) නම්‍යතා අභ්‍යාස  2) පා සරඹ  3) මණ්ඩිය  4) නමස්කාරය

5. මණ්ඩියෙහි විලුඹ දෙක අතර දුර
   1) අඩියකි  2) රියනකි  3) මිටි රියනකි  4) විග්ගුස්සකි

- **අංක 6 සිට 10 දක්වා ප්‍රශ්ණ සඳහා පිළිතුරු යා කරන්න.**

| | |
|---|---|
| 6. බෝ අත්තට වැද සිරස නමන්නේ... | නැලවිලි කවි |
| 7. පා සරඹ සඳහා වාදනය කරනු ලබන්නේ | ගැටබෙරය |
| 8. උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය | ගුරු වන්දනා |
| 9. වනගතේ පිපි මල් දෙකක් වැනි... | තාලම්පට |
| 10. අතට වෙරළු ඇහිඳ ගෙනේ... | ලී කෙලි කවි |

- **අංක 11 - 15 දක්වා ප්‍රකාශයන් නිවැරදිනම් (√) ලකුණද වැරදිනම් (x) ලකුණද යොදන්න.**

11. ලී කෙලි නැටුමක අවස්ථාවක් කැටයම් කර ඇත්තේ ඇම්බැක්කේ දේවාලයෙහිය. ( )
12. සංකීර්ණ බව සහ ශාස්ත්‍රීය බව ගැමි නැටුම් වල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයකි. ( )
13. පරිසරයේ සුන්දරත්වය පැවැත්මට වර්ණ හැඩතල චලන ආදිය බලපාන්නේ නැත ( )
14. මණ්ඩිය සහ නමස්කාරය දේශීය නර්තන සම්ප්‍රදායන් තුනෙහිම දැකිය හැක. ( )
15. බුදුන්ගේ ඉපදීම, බුදුවීම සහ පිරිනිවන් පෑම සිහිපත් කිරීම තෛපෝංගල් උත්සවේ සිදු කරයි ( )

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්ණ වලට පිලිතුරු වරහන් තුලින් තෝරා ලියන්න.**
  ( දණ්ඩි කඳ / තෛපෝංගල් / වෙසක් / මණ්ඩිය / ගැමි නැටුම් )

16. නර්තනයේ මූලික ඉරියව්ව.................................................................වේ.
17. සාමූහික බව.................................................................වල ලක්ෂණයකි.
18. තෙමඟුල සිහිපත් කරමින්.................................................................උත්සවය පවත්වයි.
19. සූර්යයා වන්දනාමාන කිරීම.................................................................උත්සවයේදී සිදු කෙරේ.
20. පා සරඹ පුහුණුවීම සඳහා අතීතයේ.................................................................උපකාර කරගෙන ඇත.

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

**1** i පරිසරයේ සුන්දරත්වය රඳා පවත්නා සාධක 2ක් ලියන්න. (ල.02)
ii ඔබ උගත් නැලවිලි කවියක් ලියන්න. (ල.02)
iii ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් නමස්කාරය ලියන්න. (ල.02)
iv මණ්ඩියේ මූලික ලක්ෂණ 2ක් ලියන්න. (ල.02)
v ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායෙහි,
1. පාද අංග හැඩ ගස්වා ගැනීම ..............................................
2. හස්ත හා පාද චලන හැඩ ගන්වා ගැනීම ..............................................
සඳහා සිදු කරනු ලබන සරඹ අභ්‍යාස වර්ග දෙක ලියන්න. (ල.02)

**2** i ඔබ දන්නා ගැමි නැටුම් 2ක් ලියන්න. (ල.02)
ii ගැමි නැටුම් වල සුවිශේෂි ලක්ෂණ 4ක් ලියන්න. (ල.04)
iii ඔබ දන්නා ගැමි නැටුම් 2ක් නම් කර එම නැටුමට අදාල කවිය බැගින් ලියන්න. (ල.04)

**3** i ඔබ උගත් හින්දු සංස්කෘතික උත්සවයක් නම් කර එය පවත්වනු ලබන මාසය නම් කරන්න. (ල.02)
ii එහි සැරසිලි සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය 3ක් නම් කරන්න. (ල.03)
iii කෝලම් රටාවක් සඳහා සුදුසු මෝස්තරයක් ඇඳ දක්වන්න. (ල.05)

**4** i ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය නම් කර එම සම්ප්‍රදායේ භාවිතා වන ප්‍රධාන ඇඳුම් කට්ටලය නම් කරන්න. (ල.01)
ii ප්‍රධාන නර්තන සම්ප්‍රදායන්ට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩය නම් කරන්න. (ල.03)
iii ප්‍රධාන නර්තන සම්ප්‍රදායන් තුන ප්‍රචලිත ප්‍රදේශ 2ක බැගින් ලියන්න (ල.06)

**5** සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ සහා විකල්ප වාද්‍ය භාණ්ඩ වෙන්කොට වගුගත කරන්න.
(දඬු බෙරය, ගොප් කොල බටනලාව, ගැට බෙරය, හොරණෑව, ටින් බෙරය, දවුල, ටොනික් පියන් වලල්ල, රබාන, උඩැක්කිය, එක්ස්රේ රබාන) (ල.2x5=06)

| සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩය | විකල්ප වාද්‍ය භාණ්ඩය |
|---|---|
| | |

## 6 ශ්‍රේණිය - නර්තනය

# පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | |
|---|---|---|---|---|
| 1. (i) | 2. (i) | 3. (ii) | 4. (iv) | 5. (iii) |
| 6. ලී කෙලි කවි | 7. තාලම්පට | 8. ගැටබෙරය | 9. ගුරු වන්දනා | 10. නැලවිලි කවි |
| 11. (√) | 12. (x) | 13. (x) | 14. (√) | 15. (x) |
| 16. මණ්ඩිය | 17. ගැමි නැටුම් | 18. වෙසක් | 18. තෛපොංගල් | 20. දණ්ඩි කඳ |

(1x20)

### II කොටස

**1** i වර්ණ, හැඩතල, චලන, නාද (1x2-ල.2)
ii නැලවිලි ගීයක් ලියා ඇත්නම් (ල.02)
iii අදාල නමස්කාරය ලියා ඇත්නම් (ල.02)
iv නර්තනයේ මූලික ඉරියව්ව වීම, මණ්ඩිය විලුඹ දෙක අතර පරතරය මිටි රියනක් වීම, පාද වල ඇඟිලි හා දණහිස් දෙක දෙපසට විහිදීම, මුළු සිරුර ඍජුව තබා ගැනීම. (1x2-ල.2)
v 1. පා සරඹ / දණ්ඩියමේ සරඹ / මණ්ඩි පද
2. ගොඩ සරඹ / ඉලංගම් සරඹ / දොඹින පද (1x2-ල.2)

**2** i ගැමි නැටුම් 2 ක් නම් කිරීම සඳහා (1x2-ල.2)
ii සරල බව / සාමූහික බව / උපකරණ භාවිතය / ගායනය සහිත වීම / එමකම / විනෝදය (1x4-ල.4)
iii ගැමි නැටුම් 2ක් නම් කර අදාල කවිය බැගින් ලිවීමට (2x2-ල.4)

**3** i තෛපොංගල් උත්සවය - ජනවාරි (1x2-ල.2)
ii අඹ කොල / ගොක් කොල / කොහොඹ කොල / කෙසෙල් ගස් / උක් ගස් (1x3-ල.3)
iii සුදුසු කෝලම් රටාවක් සඳහා (ල.05)

**4** i උඩරට - වෙස් ඇඳුම් කට්ටලය
පහතරට - තෙල්මේ ඇඳුම් කට්ටලය
සබරගමු - පබළු ඇඳුම් කට්ටලය (ල.01)
ii උඩරට - ගැටබෙරය
පහතරට - යක්බෙරය/පහතරට බෙරය...
සබරගමු - දවුල (1x3-ල.3)
iii උඩරට - මහනුවර, කුරුණෑගල, කෑගල්ල...
පහතරට - මාතර, තංගල්ල, බෙන්තර, හොරණ...
සබරගමු - රත්නපුර, කුරුවිට, කලවාන, බලංගොඩ... (2x3-ල.6)

5

| සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ | විකල්ප වාද්‍ය භාණ්ඩ |
|---|---|
| ගැට බෙරය<br>හොරණෑව<br>දවුල<br>රබාන<br>උඩැක්කිය | දඬු බෙරය<br>ගොප් කොල නලාව<br>ටින් බෙරය<br>ටොනික් පියන් වලල්ල<br>එක්ස් රේ රබාන |

(ල.2x5=10)

**ප්‍රායෝගික පරීක්ෂණය**

| | | |
|---|---|---|
| 1 | කළ ගෙඩි, ලී කෙලි, නැලවිලි කවි වලින් නම් කරන ලද ගායනයක් ඉදිරිපත් කරන්න. | (ල. 10) |
| 2 | හනුමා වන්නමේ ඔබ කැමති ගායනයක් ඉදිරිපත් කරන්න. | (ල. 10) |
| 3 | 2වන පා සරඹය හා හමාර පදය නර්තනය කරන්න. | (ල. 10) |
| 4 | පළවෙනි ගොඩ සරඹය කස්තිරම සමග නර්තනය කරන්න. | (ල. 10) |
| 5 | මගෙ පොඩි යාලු හෝ පාන්දරින් ඉස්කෝලෙට යන ගීත දෙකෙන් එකක් ගයමින් නර්තනය කරන්න. | (ල. 10) |

---

- **ප්‍රශ්ණ පත්‍රය - පලමු කොටස** ලකුණු 20
- **ප්‍රශ්ණ පත්‍රය - දෙවන කොටස** ලකුණු 30
- **ප්‍රායෝගික පරීක්ෂණය** ලකුණු 50

- **මුළු ලකුණු** ලකුණු 100

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**